# සංක්ෂිප්තය

පාසලකින් අපේක්ෂිත සමබර පෞරුෂයකින් යුත් සිසුන් දැයට දායාද කිරීමට ඔවුන් තුළ මෘදු කුසලතා හා දෘඪ කුසලතා වර්ධනය කළ යුතුය. එහිලා ශිෂ්‍ය සාධන මට්ටම් ඉහල නැංවීම සමගම ශිෂ්‍යයා වැඩ ලෝකයට හුරු කිරීම මෙන්ම ජීවන අභියෝග ජයගැනීම සඳහා පොදු නිපුණතා වර්ධනය කළ යුතුය. මෙහිදී පාසලේ ශිෂ්‍ය නායකයන් තේරීමේ ක්‍රියාවලියට සුවිශේෂී තැනක් හිමිවිය යුතුය. ඒ අනුව පාසලක සමස්ත සිසුන් හට නායකත්වය දෙනු ලබන ශිෂ්‍ය නායකයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ ව මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කෙරේ. වර්තමාන පාසල් ශිෂ්‍ය නායකත්වය රටේ අනාගත නායකයන් බිහි කිරීමේ අඩිතාලම ලෙස දැක්විය හැකි ය. ශිෂ්‍ය නායකයකු වීම තුළින් අන්තර්පුද්ගල සබඳතා, දරාගැනීමේ ශක්තිය, නායකත්ව කුසලතා, සමාජ කුසලතා, සන්නිවේදන කුසලතා, නිර්මාණශීලීත්වය ආරම්භක ශක්තිය, අනුගතවීමේ හැකියා ආදී පොදු නිපුණතා වර්ධනය වේ. ශ්‍රී ලංකාවේ පාසලෙන් පාසලට ශිෂ්‍යයන්ට තනතුරු පිරි නැමීමේ ක්‍රියාවලීන් අතර විවිධත්වයක් දැකිය හැකි ය. එම ක්‍රියාවලිය ඉතා සංකීර්ණ වන අතර ශිෂ්‍ය නායකයන් තෝරා පත් කිරීමේ දී පාසල් බලධාරීන් වඩා ප්‍රජාතන්ත්‍රවාදී වූත් විනිවිදභාවයකින් යුක්ත වූත් නිර්ණායක යොදා ගැනීමට කටයුතු කළ යුතු වේ.

වත්මන් පාසල් පද්ධතිය තුළ සිසුන්ට නායකත්ව තනතුරු ලබා දීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග විමසා බැලීම, පාසල් ශිෂ්‍යයන්ට නායකත්ව තනතුරු ලබා දීමේ ක්‍රමවේදයන්/ක්‍රියාවලීන් හි පාසල් අතර දැකිය හැකි වෙනස්කම් කවරේද යන්න විමසා බැලීම, පාසල් ශිෂ්‍යයන්ට නායකත්ව තනතුරු පිරිනැමීමේ දී අදාළ පාසල් කළමනාකරුවන් මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම, පාසල් ශිෂ්‍යයන්ට නායකත්ව තනතුරු පිරි නැමීමේ දී මුහුණ පෑමට සිදුවන අභියෝග ජය ගැනීම සඳහා පාසල් කළමනාකරුවන් යොදන උපායමාර්ග, ඒවායේ ප්‍රබලතා සහ දුබලතා හඳුනා ගැනීම සහ සිසුන්ට තනතුරු පිරිනැමීමේ ක්‍රමවේදය පිළිබඳ ව පාසලේ අභ්‍යන්තර ප්‍රජාවගේ සහ දෙමාපියන් ගේ ආකල්ප විශ්ලේෂණය කිරීම යන අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය දියත් කරන ලදී.

අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය වූයේ ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයට අයත් ප්‍රත්‍යේක අධ්‍යයන ක්‍රමවේදය යි. (Qualitative Methodology – Case Study Approach) සහේතුක නියැදියක් දත්ත රැස් කිරීමට යොදා ගන්නා ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ අධ්‍යයන කලාපයේ කාන්තා, පිරිමි සහ මිශ්‍ර ජාතික පාසල් එක බැගින් ජාතික පාසල් තුනක් යොදා ගෙන දත්ත රැස්කරන ලදී. මෙය ගුණාත්මක වර්ගයේ පර්යේෂණයක් බැවින් දත්ත රැස් කිරීමට මූලික වශයෙන් භාවිතා කරන ලද්දේ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යි. ඊට අමතර ව ප්‍රශ්නාවලි හා ලේඛන සමීක්ෂණය මගින් ද දත්ත රැස්කරන ලදී. ගුණාත්මක දත්ත ලබා ගැනීම අවශ්‍ය වන නිසා විවෘත අන්ත සහිත ප්‍රශ්නාවලි යොදා ගත් අතර සම්මුඛ සාකච්ඡා සහ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා යන ක්‍රම අනුගමනය කරන ලදී. දත්ත ලබා ගැනීම සඳහා

නියැදියේ එක් පාසලකින් විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරුවරු තිදෙනක්, දෙමාපියන් තිදෙනක් , ශිෂ්‍ය නායකයන් තිදෙනක්, ශිෂ්‍ය නායකයන් නොවන සිසුන් තිදෙනක් බැගින් දාහතර දෙනෙකු වන පරිදි පාසල් තුන සඳහා නියැදි ඒකක 42 ක් යොදා ගනු ලැබී ය.

ලබා ගත් ගුණාත්මක දත්ත භූමිගත න්‍යායට අනුව ගොඩ නගන ලද තේමා ආශ්‍රිත විශ්ලේෂණ ක්‍රමය (Grounded Theory, Thematic Analysis) උපයෝගී කරගෙන විශ්ලේෂණය කරන ලදී. සිද්ධි අධ්‍යයන විශ්ලේෂණයේ දී අපේක්ෂිත ප්‍රධාන තේමා 05 ක් සහ අනපේක්ෂිත තේමා 04 ක් හඳුනාගත හැකි විය. ඒ ඔස්සේ අධ්‍යයනයේ අවසන් නිගමන ලබා ගත හැකි විය.

ශිෂ්‍ය නායකයන් තේරීමේ දී අයදුම්පත් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම, සම්මුඛ පරීක්ෂණ සඳහා සිසුන් කැඳවීම සහ ගුරු සිසු ඡන්ද පැවැත්වීම ප්‍රධාන උපායමාර්ග ලෙස අධ්‍යයන නියැදියේ සියලු පාසල් ක්‍රියාත්මක කර ඇත. ශිෂ්‍ය නායකයන් වීමට අයදුම් කරන සිසු සංඛ්‍යාව ක්‍රමික ව අඩු වන බවත් පාසලේ තනතුරු දැරීමට වඩා තරගකාරී අධ්‍යාපන ජයග්‍රහණ පසු පස හඹායාමට සිසුන් මෙන් ම දෙමාපියන් ද කටයුතු කරන බවත් මෙම අධ්‍යයනය මගින් අනාවරණය විය. එලෙසම තනතුරු පිරිනැමීමේ ක්‍රියාවලියේ දී සිසුන් තෝරාගැනීමේ කාර්යය තුළදී විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ දෙමාපියන් ගේ බලපෑම් නිසා දක්ෂතා ඇති සිසුන්ට අසාධාරණයක් සිදුවන බව ද අනාවරණය විය. සුදුසුකම් සහිත සිසුන් අයදුම් නොකරන අතර, අඩු සුදුසුකම් සහිත සිසුන් අතරින් වඩාත් හොඳ සිසුන් තේරීමට සිදුවන අතර, එසේ තේරෙන සිසුන් සඳහා නායකත්ව ලක්ෂණ හා ගුණාංග ස්ථාපිත කිරීම ඉතා අසීරු කාර්යයක් වී ඇති බවත් අනාවරණය විය. එසේම එම තේරෙන සිසුන්ටද විදුහල්පති, ගුරු, ආදි ශිෂ්‍ය සහ දෙමාපිය බලපෑම් නිසා ශිෂ්‍ය නායකයන් තේරීමේ කමිටුවට ස්වාධීනව හා වඩා සාධාරණව එම කාර්යය සිදුකිරීම අසීරු බව ද අනාවරණය වී ඇත.

අධ්‍යයනය සහේතුක නියැදියක් හරහා සිදු කරනු ලැබූවක් වූ බැවින් නිගමන සාමාන්‍යකරණය කළ හැකි වන්නේ අදාළ නියැදියට පමණි. එනමුත් අනාවරණය කර ගනු ලැබූ සන්දර්භගත ලක්ෂණ අනෙකුත් පාසල්වල ශිෂ්‍ය නායක කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි වනු ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී පියවර අනුගමනය කරමින් විනිවිදභාවයකින් යුත් නිර්ණායක ඇසුරෙන් සිසුන්ට නායකත්ව තනතුරු පිරි නැමීම සඳහා පාසල් කළමනාකරුවන්ට සහ අනෙකුත් අධ්‍යාපන නිලධාරී පාර්ශවයන්ට ඔවුන්ගේ කටයුතු වඩාත් සාර්ථක කර ගැනීමට ඉවහල් වන සංවර්ධනාත්මක යෝජනා අවසානයේ ඉදිරිපත් කර ඇත.

## Abstract

It should be improved soft skills and hard skills of students to create human beings with balanced personality. For that increasing the student performance levels as well as developing common competencies to overcome day today challenges should be done. According to that the selection process of prefects in a school is a very important matter. So that this study pays attention towards the process of selecting prefects who guide the whole set of students of a school. The present student leadership can be stated as the base of producing leaders for the future world. Being a prefect enhances so many valuable qualities among students such as leadership qualities, social skills, communication skills, creativity, initiating power and easily adjustable ability. A variety of processes are being implemented within different school systems in selecting prefects. Since the process is found complex, the criterion used by the officials in selecting them should be more democratic and transparent.

The objectives of the study included the examining of the process that is followed in granting leaderships among students within the current school system, examining the differences of methodologies that is used in granting leaderships of various schools, identifying the challenges faced by the school managers in granting leaderships for students, identifying the strategies used by the managers to overcome the challenges and identifying strengths and weaknesses of those strategies and analyzing the attitudes of the school internal community and parents regarding the process of granting leaderships for students.

The methodology of the study is case study method which comes under qualitative method. A purposive sample has been used to collect data. Necessary data has been collected by using three different national schools in Colombo district of Colombo Educational Zone. They are a boys' school, a girls' school and a mixed school. Interviews have been used as the main method of collecting data as it is a qualitative study. Apart from it questionnaires and documentary analysis have also been used. Open ended questions were used under interviews and focused group discussions were also used because qualitative data are needed. The composition of the number of

samples were forty two including principals, deputy principals, teachers, parents, prefects and non-prefect students of each school in which the case studies were carried out.

The analysis of the collected data was done using grounded theory and thematic analysis. In analyzing the case studies five main pre determined themes and four post determined themes were identified. So the final conclusions could be obtained based on them.

It is found out that all the schools in the sample have implemented a common strategy of granting opportunity for students to apply for prefectships , interviewing and counting the votes of both teachers and students. It is also found out that the number of students who apply for prefectships decreases gradually and at the same time the interest of students as well as parents is more educational oriented rather than obtaining prefectships within school. The students who have more qualifications do not try to get prefectships and there's a uneasy task that the selection of better prefects among the students who have less qualifications of leadership skills. It is also revealed that some students are at a disadvantage due to the interference of principal and the academic staff when granting prefectships.

Since the study was done through a purposive sample, the results could be generalized only to the relevant sample. It is a true fact that the revealed characteristics could be used to enhance the development of the process of granting prefectships of various schools in the country.

The suggestions identified in this research can be useful in granting prefectships in a more democratic way using transparent criteria for which can be used by the school managers and other officials for the betterment of the system are mentioned at the end.